සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25B | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

## යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමග නොගැළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ඩැනියුබ් 2. සේන් 3. පැනමා 4. එල්බ් 5. රයින් (.....)

02. 1. රොබට් ක්ලයිව් 2. වස්කෝ ද ගාමා 3. වස්කෝද බැල්බෝවා 4. හෙන්රි හඩ්සන් 5. ජැක්වින් කාටියර් (.....)

03. 1. කැනඩාව 2. බ්‍රිතාන්‍යය 3. පෘතුගාලය 4. ස්පාඤ්ඤය 5. ප්‍රංශය (.....)

04. 1. ඇලෙක්සැන්ඩ්‍රියාව 2. ටයිබර් 3. රෝමය 4. කාර්තේජ් 5. බයිසැන්තියම (.....)

05. 1. ඔගස්ටස් 2. ට්‍රාජන් 3. හාඩ්‍රියන් 4. ස්පාටකස් 5. මාකස් අවුරේලියස් (.....)

06. 1. හොරස් 2. ඔවිඩ් 3. ලිවි 4. ටැසිටස් 5. ඇලරික් (.....)

07. 1. නිකලස් කොපර්නිකස් 2. අයිසෙක් නිව්ටන් 3. ප්‍රෙස්ටර් ජෝන් 4. ගැලීලියෝ ගැලිලි 5. පැරසෙල්සස් (.....)

08. 1. ස්ටේට්ස් ජෙනරල් 2. පාර්ලිමේන්තුව 3. ඩූමා 4. රිච්ස්ටැග් 5. මෙන්ෂෙවිග් (.....)

09. 1. 8 හෙන්රි 2. ප්‍රැන්සිස් ඩ්‍රේක් 3. 6 එඩ්වඩ් 4. 1 එලිසබෙත් 5. 1 ජේම්ස් (.....)

10. 1. වොලන්ස්ටයින් 2. මැසරින් 3. ගුස්ටාවුස් ඇඩොල්ෆ්ස් 4. පැලැටිනේට්හි ෆ්‍රෙඩ්රික් 5. ටිලී (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇතිවරහන තුළ ලියන්න.**

11. 1. ඉලියඩ් - ඔඩිසි
2. හෙරඩෝටස් - තුසිඩිඩීස්
3. රොමියුලස් - රීමස්
4. ලිවි - ටැසිටස්
5. රෝමවරු - මිලේච්ඡයෝ (.....)

12. 1. මධ්‍යධරණී මුහුද සහ රතු මුහුද - සූවස් ඇළ
2. ස්පාඤ්ඤය සහ මොරොක්කෝව - ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය
3. අත්ලාන්තික් සාගරය සහ පැසිපික් සාගරය - පැනමා ඇළ
4. උතුරුමුහුද සහ බෝල්ටික් මුහුද - කීල් ඇළ
5. කළු මුහුද සහ කැස්පියන් මුහුද - බොස්පරස් සමුද්‍ර සන්ධිය (.....)

13. 1. වැඩවසම් යුගය - සාමූහිකත්වය
2. පුනරුදය - මානවවාදය
3. ජාතික රාජ්‍යය - නව රාජාණ්ඩුව
4. ප්‍රති රෙපරමාදුව - අධර්ම මර්ධනාධිකරණය
5. සමාජවාදය - බද්ධ ව්‍යාපාර සමාගම් (.....)

14. 1. එංගලන්තය - ටියුඩර්
2. ප්‍රංශය - සාර්
3. ජර්මනිය - හැප්ස්බර්ග්
4. ඕලන්දය - ඔරෙන්ජ්
5. ප්‍රශියාව - හොහෙන්සොලර්න් (.....)

15. 1. වස්කෝද ගාමා - ඉන්දියාව
2. කබ්රාල් - බ්‍රසීලය
3. බර්තොලමියුදියෙස් - වෙනිසියුලාව
4. කොටෙස් - මෙක්සිකෝව
5. මාක්විටේ - ක්වීබෙක් (.....)

- **අංක 16 සිට 25 තෙක් වූ ප්‍රශ්න වල දක්වා ඇති Y තීරුව X තීරුව සමග අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බර්තොලමියුදියෙස් | A | 1492 |
| 2. | කොලොම්බස් | B | 1498 |
| 3. | වස්කෝද ගාමා | C | 1519 |
| 4. | කබ්රාල් | D | 1500 |
| 5. | මැගලන් | E | 1488 |

1. EABDC  2. ACBDE  3.ECBAD  4. EADCB  5. BACDE (.....)

17.

| | X | Y |
|---|---|---|
| 1. | වැඩවසම් ක්‍රමය | A අධිරාජ්‍යය ගොඩනැගීම |
| 2. | දේශගවේශනය | B වෙස්ට්පේලියා ගිවිසුම |
| 3. | රෙපරමාදු ව්‍යාපාරය | C ට්‍රෙන්ට් සම්මේලනය |
| 4. | ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය | D කැල්වින් වාදය |
| 5. | තිස් අවුරුදු යුද්ධය | E බල විකේන්ද්‍රණය |

1. CBADE 2. EDCBA 3.AECDB 4. EADCB 5. ACBDE (.....)

18.

| | X | Y |
|---|---|---|
| 1. | තෝමස් නිව් කොමන් | A ස්පිනිංජෙනි |
| 2. | ජේම්ස් හාග්‍රීව්ස් | B විදුලි බලය |
| 3. | විලියම් ගිල්බර්ට් | C වාෂ්ප එන්ජිම |
| 4. | මාර්කෝනි | D දුරකථනය |
| 5. | ග්‍රැහැම් බෙල් | E ගුවන් විදුලිය |

1. CBDEA 2. CABED 3.CDEAB 4. CEABD 5.CBDAE (.....)

19.

| | X | Y |
|---|---|---|
| 1. | පර්ඩිනන්ඩ් + ඉසබෙලා | A සහෝදරයන් |
| 2. | ජුවානා + I චාල්ස් | B රජු සහ බිසව |
| 3. | ආතර් + 8 වන හෙන්රි | C සීයා සහ මුණුබුරා |
| 4. | III වන හෙන්රි + I එලිසබෙත් | D පියා සහ දුව |
| 5. | පර්ඩිනන්ඩ් + V චාල්ස් | E මව සහ පුතා |

1. BEADC 2. CABED 3. CDEAB 4. CEABD 5. CBDAE (.....)

20.

| | X | Y |
|---|---|---|
| 1. | ප්‍රංශය | A වස්කෝ ද ගාමා |
| 2. | ඕලන්දය | B ක්‍රිස්ටෝපර් කොලොම්බස් |
| 3. | පෘතුගාලය | C ජෝන් කැබෝ |
| 4. | ස්පාඤ්ඤය | D ජැක්විස් කාටියර් |
| 5. | එංගලන්තය | E හෙන්රි හඩ්සන් |

1. DACBE 2. DEABC 3.EBCAD 4.ECDAB 5.BACDE (.....)

21.

| | X | Y |
|---|---|---|
| 1. | සැවෝයි | A හොලස්ටයින් |
| 2. | ඇල්සාස් | B නීස් |
| 3. | සාර්ඩීනියා | C බැග්ඩැග් |
| 4. | බර්ලින් | D පීඩ්මොන්ට් |
| 5. | ෂෙල්ස්විග් | E ලොරේන් |

1. BEDCA 2. ABCED 3.ECBAD 4.ACDEB 5.CABDE (.....)

22.

| | X | Y |
|---|---|---|
| 1. | ගැලීලියෝ ගැලිලි | A ඉලිප්සියාකාර ගමන් මග |
| 2. | කෙප්ලර් | B පෘතුවිය ගෝලාකාර බව |
| 3. | අයිසෙක් නිවුටන් | C දුරදක්නය |
| 4. | නිකලස් කොපර්නිකස් | D රුධිර සංසරණය |
| 5. | විලියම් හාවේ | E ගුරුත්වාකර්ෂණය |

1. CAEBD 2. BDEAC 3.EDBAC 4.ACBDE 5.EDACB (.....)

| | X | | Y |
|---|---|---|---|
| 23. | 1. මොනාලිසා | A | රෆායෙල් |
| | 2. ඇතන්ස් ගුරුකුලය | B | ආංජලෝ |
| | 3. අවසාන විනිශ්චය | C | ඩොනටෙලෝ |
| | 4. ඩේවිඩ් | D | ඩාවින්චි |
| | 5. වීනස්ගේ උපත | E | බොට්ටිචෙල්ලි |

1. DECBA 2. DCEAB 3.DABCE 4. DBAEC 5.DEBAC (.....)

| | X | Y |
|---|---|---|
| 24. | 1. මිලාන් | A ටියුඩර් |
| | 2. ෆ්ලොරන්ස් | B ගොන්සාගා |
| | 3. පුරා | C එස්ටේ |
| | 4. මාන්ටුවා | D ස්ෆෝසා |
| | 5. එංගලන්තය | E මෙඩිචි |

1. DECBA 2. DCEAB 3.DABCE 4. DBAEC 5.DEBAC (.....)

| | X | Y |
|---|---|---|
| 25. | 1. ස්පාඤ්ඤය | A ලිවර්පූල් |
| | 2. එංගලන්තය | B මාර්සෙල්ස් |
| | 3. ප්‍රංශය | C වියානා |
| | 4. ඔස්ට්‍රියාව | D මැඩ්රිඩ් |
| | 5. ජර්මනිය | E ෆ්‍රැන්ක්පර්ට් |

1. DECBA 2. DCEAB 3.DABCE 4. DBAEC 5.DEBAC (.....)

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ABCD යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
  B සහ C පමණක් නිවැරදි නම් 2 ද,
  C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
  A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම්5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. යුරෝපයේ මධ්‍යතනයුගයේ ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?
(A) රජු හා රදළයෝ අතර නිතර ගැටුම් (B) ස්වයංපෝෂිත ආර්ථිකය.
(C) සීමිත වෙළඳම (D) ස්ථාවර හමුදාව (.....)

27. පුනරුදය ඉතාලිය නම් රටෙන් ආරම්භ වීමට බලපෑ හේතු මොනවාද?
(A) ඉතාලිය සතුව පැවති ප්‍රදේශ කොටස් වලට බෙදී තිබීම.
(B) වැඩවසම් ලක්ෂණ අඩුවෙන්ම දක්නට ලැබුණු රටක් වීම.
(C) කතෝලික පල්ලියේ පූජකයන්ගෙන් ලැබුණු සහයෝගය.
(D) ඉතාලියේ පෞර රාජ්‍යාන්හි පාලකයන්ගෙන් එල්ල වූ විරෝධය. (....)

28. යුරෝපයේ රෙපරමාදු ව්‍යාපාරය ඇතිවීමට තුඩු දුන් හේතු මොනවාද?
   (A) ප්‍රංශය හා ස්පාඤ්ඤයඅතර වූ තරගය
   (B) ජර්මනියේ පැවති ආගමික මතභේද.
   (C) කතෝලික පල්ලිය තුළ වූ දූෂණ අක්‍රමිකතා
   (D) මාටිං ලූතර් ගේ නායකත්වය (.....)

29. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වර්ධනය
   (A) 1215 දි මහා අදිකාර පත්‍රය (මැග්නා කාර්ටා) අත්සන් කිරීම.
   (B) 1628 දී 1 චාල්ස් අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම පිළිගැනීම.
   (C) 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
   (D) 1776 දී ඇමරිකාවේ යටත් විජිත නිදහස ප්‍රකාශ කිරීම. (.....)

30. තිස් අවුරුදු යුද්ධයට තුඩුදුන් සාධක මොනවාද?
   (A) මාටිං ලූතර් ජර්මනියෙන් පිටුවහල් කිරීම.
   (B) 1555 ඔග්ස්බර්ග් සම්මේලනයේ ඉඩම් පිළිබඳ සමථය ක්‍රියාත්මක නොවීම.
   (C) ජර්මනියේ පැවති ආගමික මතභේද
   (D) ජර්මනියේ කුමාරවරුන් පාප්වහන්සේට විරුද්ධ වීම. (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාව යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් ලබාදී ඇති මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරි ඇති වරහන තුළ ලියන්න.**

31. ජාතික රාජ්‍යය,
   1. බලය රජු වෙත සංකේන්ද්‍රගත කරන ලද ශක්තිමත් රාජාණ්ඩුව.
   2. බලවත් වැඩවසම් රදළ පන්තිය.
   3. ශක්තිමත් ස්ථාවර හමුදාව
   4. වෙළඳාමේ ව්‍යාප්තියට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
   5. ජාතික බදු ක්‍රමයක් හඳුන්වා දීම. (.....)

32. යුරෝපයේ පුනරුදය,
   1. 1453 කොන්ස්තන්තිනෝපලය මුස්ලිම් වරුන් විසින් අත්පත් කොට ගැනීම.
   2. ඉතාලියේ ශාස්ත්‍රීය නවෝදය
   3. ග්‍රීක ලතින් ශාස්ත්‍රීය කටයුතු නව පනක් ලැබීම.
   4. දේශගවේෂණ
   5. වැඩවසම් ක්‍රමය බිහිවීම. (.....)

33. යුරෝපයේ ඇති වූ ගිවිසුම්
   1. වෙස්ට්පේලියා 2. ලැටරන් 3. මිලාන් 4. ඔග්ස්බර්ග් 5. බුඩාපේස්ට් (.....)

34. කතෝලික පල්ලියට එරෙහිව අදහස් ඉදිරිපත් කළ නායකයින්,
   1. මාටිං ලූතර් 2. උල්රිච් ස්විංග්ලි 3. ජෝන් කැල්වින්
   4. ජෝන් වෙක්ලිෆ් 5. ඉග්නේෂස් ලොයෙලා (.....)

35. ග්‍රීක සභ්‍යත්වයේ ප්‍රධාන ලක්ෂණ
   1. ප්‍රවේණි ක්‍රමය 2. බහුදේව වාදය 3. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
   4. කෘෂිකර්මය හා වෙළඳාම 5. ශාස්ත්‍රීය අධ්‍යාපනයට ඇති නැඹුරුව (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. තිස් අවුරුදු යුද්ධය යුරෝපා ඉතිහාසයේ සන්දිස්ථානයක් ලෙස පෙන්වා දිය හැකිය. | තිස් අවුරුදු යුද්ධය අවසානයේ අත්සන් කරන වෙස්ට්පේලියා ගිවිසුම යුරෝපයේ ආගමික ගැටුම් අවසන් කළ සිදුවීමයි. (.....) |
| 37. 1688 විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් එංගලන්තයේ පාර්ලිමේන්තුව රටේ ප්‍රධාන පාලන ආයතනය බවට පත්විය. | 1453 දී තුර්කීන් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීමත් සමග දේශගවේෂණ ව්‍යාපාරය ආරම්භ විය. (.....) |
| 38. ස්වයංපෝෂිත ආර්ථිකය සහ විමධ්‍යගත පරිපාලනය මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකකි. | ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය මාටිං ලූතර් විසින් සංවිධානය කරන ලදී. (.....) |
| 39. 1498 දී වස්කෝද ගාමා බහමා දූපතට ගොඩබැස්සේය. | VIII වන හෙන්රි රජුගේ පාලන සමයේ ක්‍රියාත්මක වූ රෙපරමාදු පාර්ලිමේන්තුව එංගලන්ත පාර්ලිමේන්තු වර්ධනයේ සංධිස්ථානයකි. (.....) |
| 40. ප්‍රංශය මුල්කොටගෙන මුලින්ම පුනරුදය ඇතිවිය | ඉස්ලාම් ධර්මය වැළඳගත් කොන්ස්ටන්ටයින් අධිරාජයා එම දහමට අනුග්‍රහය දැක්වීය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B | S | II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. සාඩිනියාව | 2. සේන් ගඟ | 3. බොස්පරස් සමුද්‍ර සන්ධිය |
| 4. බෝල්ටික් මුහුද | 5. නාගුස් ගඟ | 6. කීල් ඇළ |
| 7. ග්‍රීසිය | 8. පෘතුගාලය | 9. බිස්කේ බොක්ක |
| 10. ලන්ඩන් | 11. මධ්‍යධරණී මුහුද | 12. රෝමය |

(නිවැරදිව නම් කිරීමට හා ලකුණු කිරීමට ලකුණු 1 බැගිනි) (ල. 12)

02. පහත දැක්වෙන ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීකයන්ගේ කාර්ය සාඵල්‍ය පරික්ෂා කරන්න.
(i) සාහිත්‍ය (ii) දර්ශනය (iii) ග්‍රීක මූර්ති කලාව (ල. 16)

03. (i) ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වූ රටවල් තුනක් නම් කරන්න. (ල. 3)
(ii) ඉස්ලාම් අධිරාජ්‍යයට සම්බන්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන හතරක් නම් කරන්න. (ල. 4)
(iii) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ල. 9)

04. පහත සඳහන් කරුණු ඇසුරෙන් මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය පිළිබඳ විග්‍රහයක් කරන්න.
(i) ප්‍රවේණිය
(ii) බල විකේන්ද්‍රණය
(iii) සාමූහිකත්වය (ල. 16)

05. ''දේශගවේශන ව්‍යාපාරයේ අවසන් ප්‍රතිඵලය යටත්විජිතවාදයේ යුරෝපා ආධිපත්‍ය තහවුරු වීමයි.''
(i) දේශ ගවේෂණ ව්‍යාපාරයේ දායකත්වය දැක්වූ පුද්ගලයින් තිදෙනෙකු නම්කරන්න. (ල. 3)
(ii) දේශ ගවේෂණ වලට බලපෑ සාධක පිළිබඳව විමසන්න. (ල. 6)
(iii) දේශ ගවේෂණ වල ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න. (ල. 7)

06. (i) ජාතික රාජ්‍යයක පොදු ලක්ෂණ සැකවින් විස්තර කරන්න. (ල. 5)
(ii) එංගලන්තයේ ජාතික රාජ්‍යයක් වීමේ අවස්ථා උදාහරණ සහිතව විස්තර කරන්න. (ප. 11)

07. ''16 වැනි සියවසේ දී යුරෝපයේ ඇතිවූ රෙපරමාදු ව්‍යාපාරයේ අවසාන ප්‍රතිඵලය වූයේ ආගමික විප්ලවයකි.''

(i) රෙපරමාදු ව්‍යාපාරයට තුඩුදුන් හේතු මොනවාද? (ල. 7)

(ii) රෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. (ල. 9)

08. VII වන හෙන්රි රජුගේ පාලන සමයේ සිට 1928 ප්‍රතිසංස්කරණ පනත දක්වා එංගලන්ත පාර්ලිමේන්තුවේ වර්ධනයේ ප්‍රධාන අවස්ථා දක්වන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා.

(ii) වෙස්ට්ෆේලියා ගිවිසුම.

(iii)පුනරුදය ඇති වීමට බලපෑ හේතු.

(iv)ජාතික රාජ්‍ය වල පොදු ලක්ෂණ (එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)

# දෙවන වාර පරීක්ෂණය 2019 යුරෝපා ඉතිහාසය.


## පිළිතුරු

## 12 ශ්‍රේණිය 1 කොටස

| | | | |
|---|---|---|---|
| **01.** - 3 | **11.** - 5 | **21.** - 2 | **31.** - 2 |
| **02.** - 1 | **12.** - 5 | **22.** - 1 | **32.** - 5 |
| **03.** - 1 | **13.** - 5 | **23.** - 3 | **33.** - 5 |
| **04.** - 2 | **14.** - 2 | **24.** - 1 | **34.** - 5 |
| **05.** - 4 | **15.** - 3 | **25.** - 3 | **35.** - 1 |
| **06.** - 5 | **16.** - 1 | **26.** - 2 | **36.** - 5 |
| **07.** - 3 | **17.** - 4 | **27.** - 2 | **37.** - 2 |
| **08.** - 5 | **18.** - 2 | **28.** - 5 | **38.** - 1 |
| **09.** - 2 | **19.** - 1 | **29.** - 5 | **39.** - 4 |
| **10.** - 2 | **20.** - 2 | **30.** - 2 | **40.** - 3 |

**II කොටස පිළිතුරු**

01. අදාළ ස්ථාන සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 12)



02. සාහිත්‍ය : වීර කාව්‍යය - හෝමර්ගේ ඉලියඩ් හා ඔඩෙසි
ගී කාව්‍ය - පින්ඩාර්ගේ හා සැෆෝගේ නිර්මාණ
නාට්‍ය - ශෝකාන්ත, සුඛාන්ත
ඉතිහාස කෘති - උදාහරණ සහිතව විස්තර කරන්න.
දර්ශණය : * ග්‍රීක ශිෂ්ටාචාර අවදියේ ඉතා වැදගත්ම විෂය ක්ෂේත්‍රයයි.
* දර්ශනයට විෂයන් ගණනාවක් අයිති විය.
උදා : භෞතික විද්‍යාව, තාරකා විද්‍යාව,තර්ක ශාස්ත්‍රය
* මුල්කාලීන දාර්ශනියකයන්
* දාර්ශනිකයන් පිළිබඳ තොරතුරු
ග්‍රීක මූර්තිකලාව : * මානව වාදය හා ස්වභාවිකත්වය
* සාමාන්‍ය මිනිසුන්ගේ ප්‍රතිමා හා දේව ප්‍රතිමා දක්නට ලැබීම. (ල. 16)
* දේව ප්‍රතිමා මිනිස් ශරීර ලක්ෂණ වලින් නිර්මාණය කිරීම.
* පාතිනන් දේවස්ථානයේ මූර්ති
* උදාහරණ සහිතව විස්තර කිරීම.

03. (i) උතුරු අප්‍රිකාව, ස්පාඤ්ඤය, මලයාව, ඉන්දුනීසියාව, ඉන්දියාව. (ල. 3)
(ii)බැග්ඩැග්, කයිරෝ, ඔමැස්කස්, කොරඩෝවා, සෙම්ලේ, බාසිලෝනා. (ල. 4)
(iii)* නූතන යුරෝපා ශිෂ්ටාචාරය බිහිවීමට පදනම සැකසීම.
* ක්‍රි.ව. 3 වන විට රෝම අධිරාජ්‍යයාගේ සියලු ප්‍රදේශවල හා සුළු ආසියානු ප්‍රදේශ වලට කිතු දහම පැතිරී තිබීම.
* කොන්ස්ටන්ටයින් අධිරාජ්‍ය කිතු දහම වැළඳ ගැනීම.
* කිතු දහම නීත්‍යානුකූල ආගම බවට පත් කිරීම.
* ක්ලෝඩියස් රජු කිතු දහම වැළඳ ගැනීම.
* චාලිමේන් අධිරාජයා ශුද්ධ රෝම අධිරාජයා ලෙස නම් කිරීම.
* ග්‍රෙගරි පාප් වහන්සේ යටතේ පාප් තනතුර බිහිවීම.
* මිෂනාරීන් ලවා බ්‍රිතාන්‍ය හා ජර්මන් ප්‍රදේශවල කිතු දහම ව්‍යාප්ත කිරීම.
* ක්‍රිස්තු සභාව සමාජය මෙහෙයවන ප්‍රධාන බලවේගය වීම.
* කලා නිර්මාණවලට හා දේශපාලන වෙනස්කම් වලට බලපෑම. (ල. 9)

04. * කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකය.
* ප්‍රධාන ආර්ථික ඒකකය ප්‍රවේණිය, බණ්ඩාරගම.
* ආර්ථිකය ස්වයංපෝෂි බව.
* වෙළඳාම සහ මුදල් භාවිතය සීමිත වීම.
* රටේ භූමියේ හිමිකරු රජු යන සංකල්පය.
* ඉඩම් භුක්තිය පදනම් කර ගත් රජු රදල ප්‍රවේනිදාස සේවා සම්බන්ධතාව.
* ප්‍රවේණිදාසයන්, රදල අධිපතීන් පල්ලිය වෙත යම් යම් සේවාවන් ඉටු කිරීමට හා බදු ගෙවීමට බැඳී සිටීම.
* ශ්‍රේණි ක්‍රමය ක්‍රියාත්මක වීම.
* සාමූහික ජීවන රටාව.
* රදළ ප්‍රභූ පන්තිය වරප්‍රසාද භුක්ති විඳීම.
* සමාජ තරාතිරම උත්පත්තිය මත තීරණය වීම. (ල. 16)

05. (i)

| | | |
|---|---|---|
| පර්ඩිනන් සහ ඉසබෙලා | - | ස්පාඤ්ඤය |
| නාවුක හෙන්රි | - | පෘතුගාලය |
| IV වන හෙන්රි | - | ප්‍රංශය |
| vii හෙන්රි | - | එංගලන්තය |
| IV ලුවී | - | ප්‍රංශය (ල. 3) |

(ii)* 1453 ඔටෝමන් තුර්කි වරු කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම. (ආසන්න හේතුව)
* විද්‍යාත්මක ප්‍රබෝධය නිසා උතුරු තරු මාපකය, මාලිමා යන්ත්‍රය නිපදවීම.
* ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.
* ජාතික රාජ්‍ය පාලකයන්ගේ අනුග්‍රහය ලැබීම.

* කතෝලික ආගම ව්‍යාප්ත කිරීමේ අරමුණ.
* නැව් තැනීමේ තාක්ෂණය දියුණු වීම. (ල. 6)

(iii)* ආසියා, අප්‍රිකා, ඇමරිකා මහද්වීපවල සිදුවූ යුරෝපා බල ව්‍යාප්තිය.
* ක්‍රිස්තු ධර්මයේ පැතිරීම
* කාර්මික විප්ලවය.
* යුරෝපා සංස්කෘතිය ව්‍යාප්ත වීම.
* යුරෝපය යටත්විජිත සොයායාම.
* අධිරාජ්‍යවාදය.
* නව වෙළෙඳ සබඳතා ඇතිවීම. (ල. 7)

06. (i) * නිශ්චිත භූගෝලීය දේශ සීමා වලින් යුක්ත වීම.
* ස්වෛරී රාජාණ්ඩුව.
* ප්‍රාදේශීය නායකයන්ගේ බලය සීමා වීම.
* පෞද්ගලික නිල කාර හමුදා අහෝසි කිරීම.
* රජු ස්ථිර හමුදාවක් පවත්වාගෙන යාම.
* ජාතික නීති පද්ධතියක් බිහි වීම.
* ජාතික බදු ප්‍රතිපත්තිය.
* වැටුප් ලබන නිලධාරී පන්තියක් බිහි වීම. (ල. 5)

(ii)* යුරෝපයේ නැගි මුල්ම ජාතික රාජ්‍යයයි.
* නොමැන්ඩියේ පාලකයා වූ විලියම් 1066 දී එංගලන්තය ජය ගෙන බෙදී පැවති ප්‍රදේශ වරින්වර එක්සත් කිරීම.
* 1154 දී රජ වූ II හෙන්රි රජුගේ ක්‍රියාමාර්ග.
* 1486 දී බලයට පත්වූ VII වන හෙන්රි රජුගේ ක්‍රියාමාර්ග.
* VIII වන හෙන්රි රජුගේ ක්‍රියාමාර්ග.
* 1688 උත්කෘෂ්ට විප්ලවය.
* අයිතිවාසිකම් පිලිබඳ ප්‍රකාශනය.
* ප්‍රොතෙස්තන්තානු රාජ්‍යයක් පිහිටුවීමෙන් පසු එංගලන්තයේ ජාතික රාජ්‍ය ගොඩනැගීම සම්පූර්ණ වීම.
(ල. 11)

07. (i) <u>**ආගමික හේතු**</u>
* ක්‍රිස්තු සභාව දූෂිත මෙන්ම ධනවත් ආයතනයක් වීම.
* පල්ලියේ බදු අය කිරීමේ ප්‍රතිපත්තිය.
* පූජකවරුන් ලෞකිකත්වයට නැඹුරු වීම.
* පාප් ධූරය සඳහා තිබූ ගෞරවය පිරිහී යාම.
* පාප්වරුන් කිහිපදෙනකු එකවර පත්කිරීම.

<u>**ආර්ථික හේතු :**</u>
* පල්ලිය ගෙවන ලද බදු වලට ජනතාවගේ අප්‍රසාදය.
* ක්‍රිස්තු සභාව සතුව විශාල ධනයක් තිබීම.
* නව බදු පැනවීම.
* කතෝලික සභාවේ උසස් තනතුරු මුදලට අලෙවි කිරීම.
* පුණ්‍යඵල පත්‍රිකා විකිණීම දූෂිත සේවයකට පත්ව තිබීම.

<u>**දේශපාලන හේතු:**</u>
* රජු හා පාප්තුමා අතර ගැටුම් ඇතිවීම.
* ශුද්ධ රෝම අධිරාජ්‍යය හා ජර්මන් කුමාරවරුන් අතර ගැටුම් ඇතිවීම.

<u>**බුද්ධිමය හේතු:**</u>
* බයිබලය ජර්මන් හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කිරීම.
* මුද්‍රණ යන්ත්‍රය බිහිවීම.
* නිදහස් චින්තනය නිසා ක්‍රිස්තු සභාවේ මතවාද බිඳවැටීම. (ල. 7)

(ii)* එක්සත් ක්‍රිස්තු සභාව භේද වීම හේතු වීම.
* යුරෝපයේ ආගමික වශයෙන් දෙකට වීම.
* පාප්තුමාගේ බලය පිරිහීම.
* ආගමික නායකත්වය රාජ්‍ය පාලනයට යටත් වීම.
* ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වීම.
* මිෂනාරි ව්‍යාපාරය ආරම්භ වීම.
* ආගමික යුද්ධ හා ගැටුම් ඇතිවීම. (ල. 9)

08. * එංගලන්තයේ ජාතික රාජ්‍ය ආරම්භකයන් ලෙස සැලකෙන්නේ ටියුඩර් රජවරුන්ය.
* මෙකල රජු හා පාර්ලිමේන්තුව සුහදව කටයුතු කිරීම.
* ටියුඩර් පාලන කාලයේදී I ජේම්ස් දැඩි රෝමානු කතෝලිකයකු වීමෙන් පාර්ලිමේන්තුව සමග නිතර ගැටුම් ඇති වීම.
* I වෙනි චාල්ස්ගේ කාලයේ මේ තත්ත්වය තවත් උග්‍රවිය.
* 1649 රජුගේ හිස ගසා දමන ලදී.
* මින්පසු ඔලිවර් ක්‍රොම්වෙල් යටතේ සමූහාණ්ඩුවක් ඇති වුවත් එය අසාර්ථක විය.
* නැවත දෙවැනි චාල්ස් රජවී රාජාණ්ඩුවක් ස්ථාපනය කරන ලදී.
* II වැනි ජේම්ස්ගේ කාලයේදී 1688 ඇතිවූ විප්ලවය මගින් මේ ප්‍රශ්නය විසඳුනි.
* පසුව පාර්ලිමේන්තුවේ බලය ප්‍රධාන විය.
* ඕලන්දයේ විලියම් හා මේරි කුමරියට රජකම ලැබුණි.
* 1689 මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමෙන් පාර්ලිමේන්තුවේ බලය තහවුරු විය.
* මෙහි ප්‍රතිඵලයක් ලෙස අගමැති බිහිවිය.
* 1832 ලිබරල් ප්‍රතිසංස්කරණ ඇතිවිය.
* 1928 සර්වජන ඡන්ද බලය ලැබීම ආණ්ඩුක්‍රම වර්ධන විශේෂ අවස්ථාවක් විය. (ල. 16)

09. අදාල මාතෘකා සඳහා ලකුණු ලබා දෙන්න (8 x 2 = 16)